# නව අධිකරණ 50ක් ඉදිකරන්න රු. මිලියන 500ක්

ජනතාවට නීතිමය කටයුතු ඉටුකර ගැයනීම පහසු කරගැනීම සඳහා රට පුරා නව අධිකරණ 50ක් ඉදිකිරීමේ වැඩපිළිවෙළක් අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය ආරම්භ කර තිබේ.

අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ ඇමැති මිලින්ද මොරගොඩ මහතාගේ උපදෙස් පරිදි ක්‍රියාත්මක මේ වැඩපිළිවෙළ සඳහා වෙන් කර ඇති මුදල රුː මිලියන 500කට ආසන්නය.

මේ යටතේ නව මහාධිකරණ 03ක්, දිස්ත්‍රික් අධිකරණ 16ක් මහේස්ත්‍රාත් අධිකරණ 19ක් හා සංචාරක අධිකරණ 12ක් පිහිටුවීමට නියමිත බව අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ඩබ්ලිව්. ඒ. සේනාරත්න මහතා පැවසීය.

නඩු සංඛ්‍යාත්මක වශයෙන් ඉහළ යාම, මහාමාර්ගවල හා ප්‍රවාහන පහසුකම්වල ඇතිවූ වෙනස්කම්, ජන ඝනත්වයේ හා ව්‍යාප්තියේ වැඩිවීම මෙන්ම නව පොලිස් ස්ථාන, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා ග්‍රාම නිලධාරී වසම් ඇතිවීම ද නව අධිකරණ ස්ථාපිත කිරීමට තවත් හේතුවක් බව ඔහු සඳහන් කරයි.

එමෙන්ම පසුගිය සිව් වසර තුළ පමණක් රට පුරා පළාත්බද සිවිල් අභියාචන මහාධිකරණ 17ක් ස්ථාපිත කර ඇති බවත් සේනාරත්න මහතා වැඩිදුරටත් පැවසීය.